දිනමිණ සිළුමිණ epaper

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
# ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය
# පුරප්පාඩු - ව්‍යාපෘති කාර්ය මණ්ඩලය

කොළඹ නගරාශ්‍රිත දුම්රිය සේවා ව්‍යාපෘතියේ (CSRP) පවතින පහත සඳහන් පුරප්පාඩු වෙනුවෙන් ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2019 ප්‍රකාරව මහාමාර්ග අමාත්‍යාංශය විසින් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම ව්‍යාපෘතිය ආසියානු සංවර්ධන බැංකු ණය යටතේ ප්‍රවාහන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා දුම්රිය සේවය එක්ව ක්‍රියාත්මක කරනු ලබයි.

ඒ අනුව, ඉහත ව්‍යාපෘතිය තුළ පවතින පහත සඳහන් පුරප්පාඩු තනතුරු පිරවීම සඳහා ඉංග්‍රීසි භාෂාව පිළිබඳ නිපුණත්වය, රජයේ නීති රෙගුලාසි පිළිබඳ පරිචය සහ විදේශ ආධාර ලබන ව්‍යාපෘති යටතේ පුද්ගලයන් නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ පළපුරුද්ද යන පූර්ව අවශ්‍යතා සපුරාලන සුදුසුකම් සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් මෙයින් අයදුම් පත් කැඳවනු ලැබේ.

| # | පුරප්පාඩු තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 01 | සමාජ ආරක්ෂණ නිලධාරී | 01 |
| 02 | ව්‍යාපෘති ලේකම් | 01 |

## සමාජ ආරක්ෂණ නිලධාරී (PS 06) - පුරප්පාඩු සංඛ්‍යාව : 01

අදාළ අංශ විසින් සිදුකරනු ලබන සමාජ හා පාරිසරික ආරක්ෂණ වැඩපිළිවෙළ ක්‍රියාවට නැංවීම, සමීක්ෂණ කටයුතු නිරීක්ෂණය කිරීම සහ ආදාළ අංශ විසින් සිදුකරනු ලබන සමාජ හා පාරිසරික ආරක්ෂණ ක්‍රියාකාරකම් සඳහා සක්‍රියව සහභාගීවීම, නැවත පදිංචිකිරීම ක්‍රියාවට නැංවීම සහ ඉඩම් අත්පත් කරගැනීම, නැවත පදිංචි කිරීම ආදී ව්‍යාපෘතියේ සියලුම අදියරයන්ට අදාළව පැන නගිනු ලබන සියලුම සමාජ පාරිසරික ගැටලු හඳුනාගැනීමත්, නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (සමාජ ආරක්ෂණ)/ සහකාර ව්‍යාපෘති අධ්‍යක්ෂ (සමාජ ආරක්ෂණ) විසින් ගනු ලබන ප්‍රතිපත්ති තීරණවලට අනුකූලව එකී ගැටලු විසඳීම පිළිබඳ වගකීම සම්බන්ධයෙන් සමාජ ආරක්ෂණ නිලධාරියා වෙත පැවරේ.

අවශ්‍ය සුදුසුකම් :

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයේ උපාධියක් .

හෝ

අදාළ ක්ෂේත්‍රයේ උපාධියකට සමාන සුදුසුකමක් ලෙස විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක්

හෝ

අදාළ ක්ෂේත්‍රයට අයත් වෘත්තීය ආයතනයක සාමාජිකයෙකු වීම / එවැනි ආයතනයකින් ලබාගත් සමාන වෘත්තීය සුදුසුකම

සහ

දක්වා ඇති ක්ෂේත්‍රයට අදාළව අවම වශයෙන් වසර හතරක පළපුරුද්ද ( විශේෂයෙන් විදේශ ආධාර ලබන ව්‍යාපෘති පිළිබඳ පළපුරුද්ද )

## ව්‍යාපෘති ලේකම් (PS 06) – තනතුරු සංඛ්‍යාව : 01

1. ඉංග්‍රීසි සහ සිංහල/ දෙමළ භාෂාව සඳහා සම්මාන සාමර්ථ ඇතුළත්ව අ.පො.ස. සා/ පෙළ විභාගයෙන් විෂයයන් 06 ක් සමත්වී ම

හා

පිළිගත් ආයතනයකින් ලේකම් පාඨමාලාවක් හදාරා තිබීම හෝ වරලත් ලේකම්වරයෙකු වීමේ සුදුසුකම් ලබා ගත හැකි පරීක්ෂණ සඳහා හැදෑරීම්.

හා

අදාළ ක්ෂේත්‍රය තුළ අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද.

2. ආදාළ ක්ෂේත්‍රය තුළ අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද සහිත වරලත් ලේකම්වරයෙකු වීම

## වැටුප් පරාසය :

PS 6 මට්ටම –රු. 67,000.00 සිට රු. 73,000.00 (මාසික වැටුප)

## පොදු කොන්දේසි :

1. වයස් සීමාව : සෑම අයදුම්කරුවෙකුම වයස අවුරුදු 64 ට අඩු අයවලුවන් විය යුතුය. (වයස අවුරුදු 64 ට වැඩි අයවලුන් සලකා නොබැලේ.)
2. සේවක අර්ථසාධක අරමුදල සඳහා දායකත්වය (සේවකයාගෙන් 8% ක් සහ සේවා යෝජකයාගෙන් 12% )
3. සේවයෙහි යෙදවීම පිළිබඳ කොන්දේසි

ආරම්භයේදී මෙම පත්කිරීම කොන්ත්‍රාත් පදනමින් වසරක් (01) සඳහා වන අතර, සතුටුදායක කාර්යසාධනය හා ව්‍යාපෘති කාල සීමාව මත පදනම්ව සේවාකාලය දීර්ඝ කරගැනීමේ හැකියාව පවතී.

## අයදුම්පත්

ඉහත සඳහන් සුදුසුකම්වලින් හෙබි අයදුම්කරුවන් ස්වකීය අධ්‍යාපනික, වෘත්තීය සුදුසුකම් සහ දුම්රිය සේවා ක්ෂේත්‍රයන්ට අදාළ පළපුරුද්ද පිළිබඳ විස්තර සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ ද විස්තර දක්වෙන අයදුම් පත් 27/ 12 /2023 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ව්‍යාපෘති අධ්‍යක්ෂ, දුම්රිය කාර්යක්ෂමතාවය නැංවීමේ ව්‍යාපෘතිය, නො. 217, කොටා පාර, කොළඹ 08 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම් කරන තනතුර කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන් කර එවිය යුතුය.

රාජ්‍ය සේවයේ / අර්ධ රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම් පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතු අතර අයදුම්පත් නිසි කලට ලත් බව තහවුරු කරගැනීම සඳහා ඉදිරි (සෘජු) පිටපතක් එවන මෙන් ද එම නිලධාරීන්ට දැනුම් දෙනු ලැබේ.

**ලේකම්,**
**ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය,**
**07 වන මහල, "සෙත්සිරිපාය", II වන අදියර,**
**බත්තරමුල්ල.**
**05/12/2023**